1964.08.18

# දර්ශනය පිළිබඳ ප්‍රශ්න ගැන

පංති අරගලය පවතින විට පමණක් දර්ශනය තිබීමට පුළුවන. භාවිතාවෙන් වියෝවී ඥාණය සඳහා සාකච්ඡා කිරීම කාලය නාස්ති කිරීමකි. දර්ශනය අධ්‍යයනය කරන සහෝදරවරු ගම්බදට යා යුතුය. පංති අරගලයට සහභාගිවීමට ශීත ඍතුවේ හෝ ඊළඟ වසන්ත ඍතුවේ ඔවුන් එහි යා යුතුය. ශරීර සෞඛ්‍යය අයහපත් අයද එහි යා යුතුය. එහි යාමෙන් මරණය සිදු නොවේවි. සීතලට හෙම්බිරිස්සාව හටගන්නා සියළු දෙනාම අමතර ඇඳුම් ගෙන යා යුතුය. එවිට සියල්ල හරියාවි.

වර්තමානයේ විශ්ව විද්‍යාලවල කෙරෙන සංකල්පයෙන් සංකල්පයට, පොතෙන් පොතට ක්‍රමය හොඳ නොවේ. පොත්වලින් දර්ශනය එන්නේ කොහොමද? මාක්ස්වාදයේ මූලික කොටස් තුන විද්‍යාත්මක සමාජවාදය, දර්ශනය, දේශපාලන ආර්ථිකයයි. සමාජ විද්‍යාවේ පදනම පංති අරගලයයි. ධනේෂ්වර පංතිය සහ නිර්ධන පංතිය අතර අරගලය අඛණ්ඩව පවතී. මාක්ස් සහ අනිත් අය මෙය දැක්කේය. මනෝරාජික සමාජවාදීන් නිතරම ධනේෂ්වර පංතියේ කරුණාවන්ත බව ඒත්තු ගැන්වීමට උත්සාහ කරති. මෙය වැඩක් නොවේ. නිර්ධන පංතියට පංති අරගලයේ යෙදීම අත්‍යාවශ්‍යය. ඒ කාලයේ පටන්, මේ වන් තෙක් බොහෝ වැඩවර්ජන සිදුවී ඇත. ඉංග්‍රීසි පාර්ලිමේන්තුව ධනපතීන්ගේ කටයුතු සඳහා පැය 12 ක වැඩ දිනයට වඩා පැය 8 ක වැඩ දිනය වඩා වාසිදායක බව ඒත්තු ගෙන ඇත. මාක්ස්වාදය පෙනීසිටියේ මෙම දැක්මෙන්ම පටන් ගැනීමෙනි. පදනම පංති අරගලයයි. දර්ශනය අධ්‍යයනය කිරීම ඉන් අනතුරුව පමණක් සිදුවීමට පුළුවන. දර්ශනය කාගෙද? ධනේෂ්වර පංතියේ දර්ශනයද? නිර්ධන පංතියේ දර්ශනයද? නිර්ධන පංතියේ දර්ශනය මාක්ස්වාදී දර්ශනයයි. සම්භාව්‍ය ආර්ථිකය, නිර්ධන පංති ආර්ථිකයට පරිවර්තනය කිරීම, මාක්ස්වාදයයි. දර්ශනය පළමුවෙන්ම එනවා යයි විශ්වාස කරන අය, දර්ශනය අධ්‍යයනයේ යෙදෙයි.

පීඩකයෝ පීඩිතයින් පීඩාවට පත් කරති. පීඩිතයින්ට සටන් කරන්නට අවශ්‍ය අතර, දර්ශනය සෙවීම පටන් ගැනීමට පෙර, සටන් කිරීමට ක්‍රමයක් සොයයි. ජනතාව මෙය ආරම්භ කිරීමේ දැක්ම ලෙස ගන්නා විට පමණක්, ඔවුන් දර්ශනය අනාවරණය කර ගන්නේ මාක්ස්වාදය, ලෙනින් වාදය ලෙසයි. අපිද සෑම විටම මෙම ආකාරය ගෙන ඇත. අනිත් අයට මාව මරා දමන්නට ඕනෑ විය. චියැං කායි ෂෙක්ට මාව මරා දමන්නට ඕනෑ විය. අපි මෙලෙස පංති අරගලයේ යෙදෙන විට දර්ශනය ලබා ගන්නට යෙදුණි.

විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ මේ ශීත ඍතුවේ ගම්වලට යා යුතුය. මම මානව විද්‍යා සිසුන්ට විශේෂයෙන් මතක් කරනවා, අපිට වරක් දෙවරක් ඔවුන් සඳහා යෑමට හැකි වුවත් ස්වාභාවික විද්‍යා සිසුන් දැන්ම එහි නොයා යුතුය. සියළුම මානව විද්‍යා සිසුන් ඉතිහාසය, දේශපාලනය, ආර්ථික විද්‍යාව, නීතිය ඒවායේ සෑම කෙනෙක්ම ගම්බදට යා යුතුය. මහාචාර්යවරු, සහාය මහාචාර්යවරු, පරිපාලන ක්ෂේත්‍රයේ වැඩකරන අය, ශිෂ්‍යයන්, ඇතුළු සියළු දෙනාම මාස පහක කාලයක් සඳහා ගම්බදට හෝ කර්මාන්ත ශාලාවලට යන්නේ නම්, ඔවුන් දැනුවත් භාවයේ හැඟිම් සමහරක් අත්කර ගනිවි. අශ්වයින්, දෙනුන්, බැටළුවන්, කුකුලන්, බල්ලන්, ඌරන්, වී, සෝගම්, බෝංචි, තිරිඟු, විවිධ මෙනේරිවර්ග මේ සියළුම දේවල් ගැන විමසිල්ලෙන් දැක ගනු ඇත. ශීත කාලයේ යන්නේ නම්, ඔවුන් අස්වැන්න නොදකීවි. අඩු වශයෙන් විශ්ව විද්‍යාලයකින් ඉල්ලා සිටින දෙය, පංති අරගලයේ අත්දැකීම් ටිකක් ලබා ගන්නා ලෙසයි.

ජනතා විශ්ව විද්‍යාලයද, පීකිං විශ්ව විද්‍යාලයද වඩා හොඳ යයි ඔවුහු තර්ක කරති. මම ග්‍රීන් වුඩ් විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයෙක් වශයෙන් සිටියදී ටිකක් ඉගෙන ගත්තා. අතීතයේදී මම කොන්ෆියුසියස් ගැන අධ්‍යනය කලා. සම්භාව්‍යය කෘති පහ සහ පොත් හතර සඳහා හය අවුරුද්දක් මම ගත කළෙම්. මම ඒවා මතකයෙන් කියවීමට ඉගෙන ගතිමි. නමුත් මට ඒවා නොවැටහුණි. ඒ කාලයේ මම කොන්ෆියුසියස්ව ගැඹුරින් විශ්වාස කළෙමි. (ඔහුගේ අදහස් අනාවරණය කරමින්) රචනා පවා ලියා ඇත. ඉන් පසු හත් අවුරුද්දක්ම මම ධනේෂ්වර පාසැලකට ගියෙමි. අවුරුදු හය සහ හත එකතු කල විට අවුරුදු දහතුනකි. මම සාමාන්‍යයෙන් ධනේෂ්වර වල්පල් සියල්ලම, ස්වභාව විද්‍යාව, සහ සමාජ විද්‍යාව අධ්‍යයනය කළෙමි. ඔවුන්ට ශික්ෂණ ශාස්ත්‍රයෙන්ද ටිකක් ඉගැන්වීමි. මේ කාලය සාමාන්‍යය පාසැලක අවුරුදු පහකුත්, මධ්‍යම පාසැලක අවුරුදු දෙකකුත් අඩංගු වෙයි. ඒ කාලයෙහිම පුස්තකාලයේද මම ගත කළෙමි. ඒ කාලයෙහි මම කාන්ත් ගේ ඥාණවාදය විශ්වාස කලෙමි. විශේෂයෙන්ම ඔහුගේ විඥාණවාදය විශ්වාස කලා. මගේ මූලයන් රදළවාදී සහ ධනේෂ්වර ප්‍රජාතන්ත්‍රවාදයට පක්ෂපාතී විය. විප්ලවයට සම්බන්ධ වීමට සමාජය මාව පෙළඹවීය. මම ප්‍රාථමික පාසැලක ගුරුවරයෙක් වශයෙන් අවුරුදු කීපයක් සහ මධ්‍යය පාසැලක අවුරුදු හතරක් විදුහල්පති වරයෙක් වශයෙන් ගත කළෙමි. මම අවුරුදු හයක්ම චීන භාෂාව සහ ඉතිහාසයද පාසැලක ඉගැන්වීමි. මම මධ්‍යම පාසැලක කෙටි කාලයක්ද ඉගැන්වීමි. නමුත් මට කිසි දෙයක් නොවැටහුණි. මා කොමියුනිස්ට් පක්ෂයට එකතු වූ විට අපි විප්ලවය කල යුතු බව මම දැන ගතිමි. නමුත් කුමකට විරුද්ධව? අපි එය පතුරුවන්නේ කොහොමද? සැබවින්ම පැරැණි සමාජයට සහ අධිරාජ්‍යවාදයට විරුද්ධව විප්ලවය කරන්නට අපට සිදුවිය. අධිරාජ්‍යවාදය ගැන කියන දෙය මට හරියට වැටහුණේ නැත. එයට විරුද්ධව විප්ලවය කරන හැටි පිළිබඳව වැටහුණේ එයටත් වඩා අඩුවෙණි. මම, අවුරුදු දහතුනක් තුල ඉගෙන ගත් දේවල් විප්ලවය කිරීම සඳහා කිසිම හොඳක් නොවීය. මම, භාෂාවේ

උපකරණයක් ලෙස පාවිච්චි විය. රචනා ලිවීමේ උපකරණයක් විය. මගේ අධ්‍යනයේ සංකල්ප මට කොහෙත්ම ප්‍රයෝජනවත් නොවීය. "මනුෂ්‍යත්වයේ මූලික ස්වභාවය කරුණාවන්ත කමයි. කරුණාවන්ත මිනිසා අනිත් අයට ආදරය කරයි" කොන්ෆියුසියස් කියා ඇත. ඔහු ආදරය කළේ කවුරුන්ටද? වෙනසක් නැතිව සියළුම මිනිසුන්ටද? ඔහු සූරා කන්නන්ට ආදරය කළේද? එය හරියටම පැහැදිලි නොවීය. ඔහු සූරා කන්නන්ගෙන් කොටසකට ආදරය කළේය. අනිත් කාරණය කොන්ෆියුසියස්ට උසස් නිලධාරියක් වීමට හැකි නොවූයේ ඇයිද? ජනතාවට ඔහුව උවමනා නොවීය. ඔහු ඔවුන්ට ආදරය කළේය. ඔවුන්ව එක්සත් කිරීමට උවමනා විය. නමුත් එහි දුර්භික්ෂය ආවිට වඩා උසස් මිනිසාට දුප්පත් නොවී පැවතීමට පුළුවන. ඔහුට තව ඩිංගකින් ඔහුගේ බිරිඳ නැතිවීමට පුළුවන. කුවාන්ගේ මිනිසුන්ට ඔහුව මරා දමන්නට උවමනා විය. චින්, ඔහුගේ බටහිර සංචාරය සඳහා ඔහුට ආරාධනා නොකිරීමෙන්, ඔවුන්ව විවේචනය කර තිබුණි. උත්තර ධ්‍රැවයේ සිට දක්ෂිණ ධ්‍රැවය දක්වා තාරකා පහ පසු කිරීමේ මාස හත තුල වෘත්තාන්ත කාව්‍යයේ යථාර්ථය සෙන්සිවල සිද්ධි මතක් කරයි. "කහ කුරුල්ලාහිද" චින් විසින් මරා දමන ලද, ඔහුගේ මළ සිරුරත් සමග වළදමන ලද, ඩුක් ඩුගේ උසස් නිලධාරීන් තිදෙනා ගැන කථා කරයි. " සුසුවා චියන්" වෘත්තාන්ත පොතෙහි ඉතා උසස් උපදෙස් දී ඇත. ඔවුන් ප්‍රබෝධමත් වූ විට පුරාණ කාලයෙහි වටිනා කම් සහ මුනිවරයන් විසින් ලියන ලද සියල්ල කවි තුන් සියයෙහි අඩංගු බව ඔහු කියා ඇත. වෘත්තාන්ත පොතෙහි කවිවලින් විශාල ප්‍රමාණයක විවිධ රටවල සිරිත් විරිත්, සහ පොදු ජනතාවගේ ජනගී අඩංගු වෙයි. මුනිවරයන් සහ අනිකුත් අය පොදුජනයාට වඩා උසස් නොවෙති. ඔවුන් ප්‍රබෝධමත් වූ විට ලිවීම, මිනිසාගේ හදවත කෝපයෙන් පිරී තිබීම අදහස් කරයි.

ඔහු කවියක් ලීවේය.

නුඹ වැපිරුවේ නැත්නම් අස්වනු නෙළා ගන්නේ නැත,<br>
නුඹ ගේ  තුන්සියයක් රවුම් බෝංචි වලින් වී ලබා ගන්නේ කොහොමද?<br>
නුඹ හඹායන්නේ නැතිව ලුහුබඳින්නේ නැත,<br>
නුඹගේ ගෙවත්තෙහි එල්ලෙන වවුලන්,<br>
අපි දකින්නේ කොහොමද?<br>
ඕ උසස් මිනිසා,<br>
අලසකමේ පාන් නොකෑ යුතුය.

පාලකයින්ට එරෙහිවන දෙව්ලොවට දෝෂාරෝපණය කරන කවියකි. කොන්ෆියුසියස්ද වඩා ප්‍රජාතන්ත්‍රවාදී විය. මිනිසා සහ ගැහැණිය අතර ආදරය ගැන (වෘත්තාන්ත පොත්වල) කවි අන්තර්ගත කළේය. රහසිගත ආදර කටයුතු ගැන ඔහුගේ විස්තර කල කවි, චූසිහි ස්වභාවය විය. සමහර ඒවා යථාර්ථවීදී විය. සමහර ඒවා යථාර්ථවාදී නොවේ. රජ කුමාරයා සහ මානසිකය අතර සම්බන්ධතාවයන් ගැනද, මිනිසා සහ ගැහැණිය අතර මනඃකල්පිතද, පසුව ණයට ගත් ඒවාය. සූවල (දැන් සෙවුවාන්) "රටවල් දහය" සහ රජ පෙළපත් පහ, සීත සෘතුව, චින් ලැඹන්ගේ බිරිඳ වෙයි. චුවාන්ගේ විසින් ලියන ලද කාව්‍යයක් තිබිණි. ඔහු ඔහුගේ තරුණ කාලයේ එය ලීවේය. එය රජ කුමාරයා සඳහා ඔහුගේ දැන් ආශාව විය.

මෙම කාරණයේ ගැඹුරට යාමටත්, ඒමටත් පංති අරගලයට සහභාගිවීමට සහ පටන් ගැනීමට, වාරක්‍රමයට සහ කණ්ඩායම් වශයෙන් ජනතාව වෙත යා යුතුයි. මේ ආකාරයෙන් පමණක් විප්ලවය ගැන යම් දෙයක් ඉගෙන ගත හැකිය. බුද්ධිමතුන් දිනපතාම කිසිම ඇවිදීමක් සහ වැඩක් නොකර හොඳින් අඳිමින්, ආහාර ගනිමින් රජයේ කාර්යාලවල වාඩිවී සිටිති. නුඹලා අසනීප වෙන්නේ ඒ නිසයි. ඇඳුම්, ආහාර, නිවාස සහ ව්‍යායාම අසනීප වීමේ ප්‍රධාන කාරණ හතරයි. හොඳ ජීවන තත්වයකින් විනෝද වේ නම් නුඹ නරක තත්වයට වෙනස් වෙනවා. නුඹ පංති අරගලයට සහභාගි වීමට යන්නේ නම්, විරුද්ධ කාරණා පහ සහ පිරිසිදු කිරීමේ හතර මධ්‍යයේ නුඹ යන්නේ නම්, නුඹ දුෂ්කර කාලයක් ඉවසන්නේ නම්, බුද්ධිමතුන් වන නුඹලා, නුඹලා ගැන අළුත් දැක්මකින් සිටීවි.

පංති අරගලයේ නුඹ නොයෙදෙන්නේ නම්, එවිට නුඹ ලබා ගන්නා දර්ශනය කුමක්ද?

එයට උත්සාහ කරන්නට නොයන්නේ ඇයි? නුඹගේ අසනීපය සුව නොවන්නේ නම් ආපසු ආ යුතුය. නුඹට අවසානයේදී ක්‍රියාමාර්ගය අඳින්නට ඇත. නුඹ එලෙස අසනීප වී මරණය ආසන්නයේ නම්, නුඹ ඉක්මනින් ආපසු ආ යුතුය. නුඹ එහි යනවාත් සමගම පිවයක් ලබා ගනීවි. (*කාන්ග් ෂෙන්ග් උපුටා දැක්වීමකි: විද්‍යා ඇකඩමියේ සමාජ විද්‍යාව සහ දර්ශනයේ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ ආයතන සියල්ලටද ගම්බදට යා යුතුය. වර්තමානයේදී ඒවා ඇවිස්සීමේ පරිත්‍යාගය ආශ්වාස කිරීමෙන්, සුරලොවක් පෝෂණය කිරීම හැරවීමේත් පැරැණි අධ්‍යාපන ආයතන හැරවීමේත් අද්දරට පැමිණ ඇත. දර්ශනයේ ආයතනයේ කුවාන්ග් මින්ග් පී පායී කියවූ ජනතාව ඇත.*) කුවාන්ග් මින්ග් පී පායී මා පමණක් කියවා ඇත. පීපල්ස් ඩේලි න්‍යායික ලිපි පල නොකරන නිසා මම පීපල්ස් ඩේලි නොකියවයි. අපි තීරණයක් ගැනීමෙන් පසු එහි ඒවා ප්‍රසිද්ධ කරාවි. මහජන විමුක්ති හමුදාවේ " දිනපතා" පුවත්පත සජීව වේ. එය කියවීමට පුළුවන. (සහෝදර කාන්ග් ෂෙන්ග්: සාහිත්‍යමය ආයතන චෞවු කුචෙන් හිට අවධානය යොමු කරයි. ආර්ථික ආයතන සනිග් යෙහි ෂැන්ග්ට අවධානය යොමු නොකරයි.)

ධනවාදය සඳහා යන්ට ඔවුන්ට ඉඩ දෙන්න. සමාජය ඉතා සංකීර්ණය. කෙනෙක් ධනවාදය සඳහා නොව සමජවාදය සඳහා පමණක් යන්නේ නම් එයද සරල නොවේ. එවිට අපි එක් පැත්තක් නිකම්ම දකින

විරුද්ධාර්ථයන්ගේ ඒකත්වය නොදකින අය විය යුතුය. ඔවුන්ට එසේ කරන්ට ඉඩ දෙන්න. පිස්සුවෙන් අපට පහර දෙන්ට ඉඩ දෙන්න. වීදිවලදී විරුද්ධ උනාවේ. කැරලි ගසන්ට ඒකරාශී උනාවේ. මම මේ සියළු දේවල් අනුමත කරන්නෙමි. සමාජය ඉතා සංකීර්ණය. එහි එක් කොමියුනයක් වත් නොමැත. එකක් දෙකක් බවට බෙදිය නොහැකි මධ්‍යම කාරක සභාවේ එක් දෙපාර්තමේන්තුවක්වත් නැත. දැන් හරියට බලන්න, ග්‍රාමීය වැඩ දෙපාර්තමේන්තුව විසුරුවා හැර නොමැතිද? "ශ්‍රේෂ්ඨ නිදහස් හතර" ප්‍රචාරය කර හරිත්ම සහ වෙන වෙනම පදිංචිනිවාස පදනම මත ගණන් තබන්ට එයම විවෘත කළේය. මුදල් ණයට දීමේ නිදහස, ශ්‍රමය කුලියට ගැනීමේ නිදහස, වෙළඳාමේ යෙදීමේ නිදහස, ඉඩම් මිලදී ගැනීමේ සහ විකිණීමේ නිදහස," අතීතයේදී ඔවුන් ප්‍රකාශයන් නිකුත් කර ඇත. (මේ උත්සාහයට) ටෙන්ග් සූ හුයි මා සමග වාදයක් කර ඇත. මධ්‍යම කාරක සභාවේ රැස්වීමකදී "ශ්‍රේෂ්ඨ නිදහස් හතර" සම්පූර්ණයෙන් ක්‍රියාවේ යෙදිය යුතුය යන අදහස ඔහු ඉදිරියට දැම්මේය.

නව ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්ට, එය තහවුරුකරගෙන යාම, එය සැමදාම ධනවාදයේ යෙදීම වේ. නව ප්‍රජාතන්ත්‍රවාදය නිර්ධන පංති නායකත්වය යටතේ ධනේෂ්වර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයයි. කොම්ප්‍රදෝරු ධනේෂ්වර පංතිය සහ ඉඩම් හිමියන් සමග පමණක් එය ගැටෙයි. ගොවීන්ට ඉඩම් බෙදා දීම, රදළ ඉඩම් හිමියන්ගේ දේපල ගොවීන්ගේ වෙන් වෙන්වූ දේපල බවට පරිවර්තනය කිරීම, මෙය ධනෙෂ්වර විප්ලවයේ සීමාවන් තුල තවමත් පවතියි. ඉඩම් බෙදා දීම අපූර්ව දෙයක් නොවේ. ජපානයේ ඉඩම් මැක් ආතර් බෙදා දුන්නේය, නැපෝලියන්ද ඉඩම් බෙදා දුන්නේය, ඉඩම් ප්‍රතිසංස්කරණය ධනවාදය අහෝසි නොකරයි. සමාජවාදයට එයට නායකත්වය දිය නොහැක.

වර්තමානයේ අපේ රාජ්‍යයේ බලයෙන් තුනෙන් එකකට ආසන්න ප්‍රමාණයක් සතුරා හෝ සතුරා පසුපස යන්නන්ගේ අත්වල පවතී. අපි අවුරුදු 15 ක්ම රාජ්‍යය ගෙනයමින් සිට ඇත. අපි දැන් රාජ්‍යයෙන් තුනෙන් දෙකක් පාලනය කරනවා. වර්තමානයේදි සිගරැට් පැකට් කීපයකට ශාඛා ලේකම්වරයෙක් නුඹට මිලදී ගත හැක. ඔහුට දුවක් විවාහ කරදීමේ අදහසින් නොවේ. සාමකාමීව ඉඩම් ප්‍රතිසංස්කරණය කල ප්‍රාදේශිකයන් සමහරක් ඇත. ඉඩම් ප්‍රතිසංස්කරණ කණ්ඩායම් ඉතා දුර්වලය. දැන් නුඹට ප්‍රශ්න තොගයක් තිබෙන බව දැකිය හැක.

දර්ශනය පිළිබඳ ද්‍රව්‍යවාදය මට ලැබී ඇත. මට වටපිටාව පරීක්ෂා කිරීමට ඉඩ ලැබී ඇත. මට විවේකයෙන් කියවීමට හැකියාව ලැබී නැත. මම විග්‍රහය සහ සංකලනය පදනමින් ද්‍රව්‍යවාදය දෙස පරීක්ෂාවෙන්ද සිට ඇත.

විරුද්ධාර්ථයන්ගේ ඒකත්වය පිළිබඳ මේ වගේ ද්‍රව්‍යවාදය එකතුකිරීම හොඳ දෙයකි. ධනේෂ්වර පංතිය ඒ ගැන කියන්නේ කුමක්ද? මාක්ස්, එංගල්ස්, ලෙනින් සහ ස්ටාලින් ඒ ගැන කියන්නේ කුමක්ද? සංශෝධනවාදීන් ඒ ගැන කියන්නේ කුමක්ද? ධනේෂ්වර පංතිය වෙනුවෙන් යැංග් සින් චෙන් ඒ ගැන කථා කරයි. පුරාණයේ හේගල් ඒ ගැන කථා කළේය. එවැනි මිනිස්සු පෙර දවස්වල ජිවත්විය. දැන් ඒවා වඩා නරකය දේව දෘෂ්ටිය ගැන කථා කරන්ට ප්‍රයෝජනවත්වූ ලුනාචාර්ස්කි සහ බොඩානොව්ද සිටියහ. මම බොඩානොව්ගේ ආර්ථික විද්‍යාව කියවා ඇත. ලෙනින් එය කියවීය. ප්‍රාථමික ඒකරාශී කිරීමේ කොටස ඔහු යෙදවූ බව එයින් පෙනෙයි. *(සහෝදර කාන්ග් ෂෙන්ග්: බොඩානොව්ගේ ආර්ථික මතවාදයන් නූතන සංශෝධන වාදයට වඩා අවබෝධය ලබා දී තිබුණි. කෙළුම්ස්කිගේ ආර්ථික මතවාදයන් කෘෂෙව්ගේ ඒවාට වඩා අවබෝධය ලබාදී තිබුණි. යුගොස්ලෝවියාවද සෝවියට් සංගමයට වඩා අවබෝධය ලබා දී තිබුණි. සියල්ලටම පසුව සිපිලස් ස්ටාලින් පිළිබඳව හොඳ දේවල් කීපයක් ප්‍රකාශ කර තිබුණි. චීන ප්‍රශ්න පිළිබඳව ස්ටාලින් ස්වයං විවේචනයක් කර තිබුණ බව ඔහු ප්‍රකාශ කර කළේය.)*

චීන ප්‍රශ්න සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී වැරැදි සිදුවී ඇති බවත්, ඒවා සුළු වැරැදි නොවන බවත් ස්ටාලින්ට දැනුණි. දශලක්ෂ සිය ගණනක් ජනතාව වෙසෙන උසස් රටක අපි සිටිමු. බලය අල්ලා ගැනීමට සහ අපේ විප්ලවයට ඔහු විරුද්ධ විය. මුළු රටේම බලය අත්පත් කර ගන්නට ක්‍රමානුකූලව අවුරුදු බොහෝ ගණනක් අපි සූදානම්ව සිටියෙමු. ජපන් විරෝධී යුද්ධයේදී මුළු කාල වකවානුවේම සූදානම අපි ස්ථාපිත කළෙමු. නව ප්‍රජාතන්ත්‍රවාදය ගැන ඇතුලත් ඒ කාල පරිච්ඡේදයේදී මධ්‍යම කාරක සභාවේ ප්‍රකාශන නුඹ සොයා බලන්නේ නම්, මෙය හරියටම පැහැදිලි වේ. නුඹට ධනේෂ්වර ආඥාදායකත්වයක් පිහිටුවිය නොහැකි බව එය කියයි. නිර්ධන පංති නායකත්වය යටතේ පමණක් නව ප්‍රජාතන්ත්‍රවාදය නුඹට ස්ථාපිත කල හැක. නුඹට නිර්ධන පංති නායකත්වයෙන් මහජන ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය ස්ථාපිත කල හැක. අපේ රටේ අවුරුදු අසූවක්ම ප්‍රජාතන්ත්‍රවාදි විප්ලවයන් සියල්ලටම නායකත්වය දීමට ධනේෂ්වර පංතිය අසමත් වුණා. ධනේෂ්වර ප්‍රජාතන්ත්‍ර විප්ලවයට අප නායකත්වය දීමෙන් එක්තරා ජයග්‍රහණයක් ලැබුහ. මෙය පලමු පියවරයි. දෙවැනි පියවර සමාජවාදයට පියවර තැබීමයි. මෙසේ නව ප්‍රජාතන්ත්‍රවාදය සම්පූර්ණ වැඩ පිළිවෙලක් විය. දේශපාලනය, ආර්ථිකය, මෙන්ම සංස්කෘතිය එය සාකච්ඡා කලා. එය යුධමය කටයුතු පමණක් සාකච්ඡා කරන්නට අසමත් වුණා. *(සහෝදර කාන්ග් ෂෙන්ග්: නව ප්‍රජාතන්ත්‍රවාදය ලෝක කොමියුනිස්ට් ව්‍යාපාරය සඳහා ඉතා වැදගත්, මම ස්පාඤ්ඤ සහොදරවරුන්ගෙන් ඇසූ විට, නව ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්නට නොව ධනේෂ්වර ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්නට තිබෙන ප්‍රශ්න ඔවුන් කියා සිටියා. ඔවුන්ගේ රටේ කරුණු තුනක් සම්බන්ධයෙන්, හමුදාව, ගම්බද දේශපාලන බලය පිළිබඳව ඔවුන් සම්බන්ධ වී නොතිබුණි. ඒවා සම්පූර්ණයෙන්ම සෝවියට් විදේශ ප්‍රතිපත්තියේ අවශ්‍යතාවයන්ට යටත්ව පැවැතුණි. වෙනත් කිසිම දෙයක් මුදුන්පත් නොවීය)* මේවා

චෙන් තු හියුගේ දේශපාලනයන් වෙති. *(සහෝදර කාන්ග් ෂෙන්ග්: කොමියුනිස්ට් පක්ෂය හමුදාවක් සංවිධානය කරන බවක්, එවිට අනික්වා හරවන බවත් ඔවුන් කියති. )* මෙය අප්‍රයෝජනවත්ය.

*(සහෝදර කාන්ග් ෂෙන්ග්: ඔවුන්ටද දේශපාලන බලය උවමනා නොවීය. ඔවුන් ගොවි ජනතාව පුහුණු නොකළේය. එම කාලයෙහි නිර්ධන පංති නායකත්වයට නීති පනවන බව සෝවියට් සංගමය ඔවුන්ට කියා තිබුණි. එංගලන්තය සහ ප්‍රංශය එයට විරුද්ධ විය. මෙය සෝවියට් සංගමයට යහපත් නොවීය. )*

කියුබාව ගැන කොහමෙද? කියුබාව නිවැරදිව හමුදාවක් සහ දේශපාලන බලය අත්පත් කරගන්නට ඔවුනොවුන්ම සම්බන්ධ විය. අපි අතීතයේදී කලා මෙන් ගොවි ජනතාවද ඒකරාශී කළේය එමනිසා ඔවුන් ජයග්‍රහණය කලේය.

(සහෝදර කාන්ග් ෂෙන්ග්: ධනේෂ්වර පංතියේ ආකාරයෙන්, ක්‍රමවත් යුද්ධයක ඔවුන්ද (ස්පාඤ්ඤ) සටන් කලේය. ඔවුන් අන්තිමට මැඩ්රිඩ් ආරක්ෂා කලේය. මේ සියළුම දේවල් සෝවියට් විදේශ ප්‍රතිපත්තියට යටත් කලේය.)

තුන්වෙනි ජාත්‍යන්තරය විසුරුවා හැරීමට පෙර පවා තුන්වෙනි ජාත්‍යන්තරයේ නියෝගවලට අපි එකඟවූයේ නැත. ටුසින්හි සමුළුවේදී අපි එකඟ නොවීය. ඉන් අනතුරුව අවුරුදු දහයක්ම ප්‍රතිශෝධන ව්‍යාපාරයක් ඇතුලත්ව හත්වෙනි සමුළුව අවසානයේ තීන්දුවක් ගෙන " වාමාංශික වාදය" නිවැරදි කලේය. (අපේ පක්ෂයේ ඉතිහාසය ප්‍රශ්න කීපයක් ගැන විසඳුම) අපි කොහෙත්ම ඒවාට එකඟ නොවීය. ආධානග්‍රාහීන් චීනයේ විශේෂතත්වයක් අධ්‍යයනය කරන්නට සම්පූර්ණයෙන්ම අසමත් වුණා. අවුරුදු දහයකට පසු ඔවුන්ට ගම්බද අධ්‍යයනයේ යෙදෙන්ට සිදු විය. ගම්බද පංති සම්බන්ධතාවයන් සහ දේපල ඉඩම් අධ්‍යයනය කරන්ට ඔවුන් සම්පූර්ණයෙන්ම අසමත්වුණා. එහි යෑමෙන් වුවද නුඹට ගම්බද වටහා ගත නොහැක. ගම්බද ස්ථර සහ සියළුම පංතීන් අතර සම්බන්ධතාවයන් නුඹ අධ්‍යයනය කල යුතුය. අවසාන වශයෙන් මම ඒවා පැහැදිලි කර දෙන්ට පෙර අවුරුදු දහයකටත් වඩා මෙම ප්‍රශ්ණවලට කැපවී සිටියෙමි. සුදුවෙහි යෙදි සිටින හෝ නිවාසවල සියළුම වර්ගයේ මිනිස්සු සමග නුඹ සම්බන්ධතාවයන් සෑදිය යුතුය. ඒවා හොඳින් පරික්ෂා කල යුතුය. 1925 මම ගොවි පුහුණු ව්‍යාපාරයේ පුහුණු ආයතනයේ ක්‍රියාකාරීව සිටියෙමි. ගම්බද සෝදිසි කරන්ට දුප්පත් ගොවීන් තෝරා ගත්තෙමි. ඔවුන්ගේ ජීවිත ඉතා දුක්ඛිතය ඔවුන්ට කෑමට කිසිත් නැත. මගේ සෝදිසියේදී දාදු ක්‍රීඩාව සෙල්ලම් කරන්නට පුළුවන් ගොවියෙක් සිටියේය. (දිව්‍ය ලෝක, මිනිසා, පොළොව, එකමුතුකම, මෙයි චියන්, චැන්ග්සෑන්ග්, සහ එලකය) අනතුරුව කෑම වේලකට ආරාධනා කළෙමි. ගම්බද පංති අරගලය එතරම් තියුණු ඇයි දැයි වටහා ගන්නට පුලුවන් උණා. ඔහු මට කථා කරන්ට කැමති වූ කාරණා තිබිණි. පළමුව මම ඔහු දෙස මිනිසෙක් වශයෙන් බැලිමි. දෙවනුව මා සමග ආහාර වේලකට ආරාධනා ලැබීම, තෙවනුව මුදල් වලින් කොටසක් සාදා තිබුණි. ඔහුව ඉතා හොඳින් සෑහීමට පත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මා ආරක්ෂිතව තබාගත්, රිදී ඩොලර් එකක් හෝ දෙකක් මට නැතිවිය. විප්ලවයෙන් පසුව දෙවරක් මාව දකින්නට පැමිණි මිත්‍රයෙක් සිටියේය. ඒ දවස්වල ඔහු ඇත්තටම වැරැදි මගේ සිටියේය. ඩොලරයක් ණයට ලබාගැනීමට වරක් මාව සොයා ගෙන ආවේය. ආපසු නොඉල්ලන උපකාරයක් වශයෙන් මම ඩොලර් තුනක් ඔහුට දුනිමි. ඒ දවස්වල එවැනි ආපසු නොඉල්ලන උපකාරයක් කරන්නට ඉතා අමාරුය. මිනිසෙක් ඔහු ගැන බලා ගන්නේ නැත්නම් දිව්‍යලෝකයේ සහ පොළවේදී ඔහුට දඬුවම් දියයුතු බව මගේ පියාගේ දැක්මයි. මගේ මව ඔහුට විරුද්ධ විය. මගේ පියා මිය ගිය විට මිනිස්සු කීප දෙනෙක් අවමඟුල් පෙරහැරේ ගමන් කලේය. මගේ මව මිය ගිය විට බොහෝ දෙනෙක් අවමඟුල් පෙරහැරේ ගමන් කළේය. එක් සැරයක් කෝලාන්හුයි අපේ ගෙදර මංකොල්ල කෑවේය. ජනතාවට කිසිත් නොමැති නිසා එය හරි බව මම කියා සිටියේය. මගේ මවට පවා මෙය කිසිසේත්ම ඒත්තු ගැන්වීමට නොහැකි විය.

වරක් ප්‍රාදේශීය ආණ්ඩුකාරයාට තලා දමා චැන්ග්සා සහල් දුරාචාරය කඩා බිඳ දැම්මේය. සියැන්ග් සිං වලින් පැමිණි පොට්ටනිකාරයින්ට ඔවුන්ගේ පළල් බෝංචි විකුණා දමා ඉබාගාතේ ආපසු ගියේය. තත්වය ගැන ඇසීම මම නවතා දැමූයෙමු. රතු සහ කොළ කල්ලි ගම්බද රැස්වීම් පවත්වා ලොකු පවුල් කා දැම්මේය. ෂැංහයි පුවත්පත්වල මෙම වාර්ථා පල විය. චැන්ග්ෆා වලින් හමුදා කණ්ඩායම් යවන විට කලබල අවසාන වී තිබුණි. ඔවුන් හොඳ විනයක් ලබාගෙන නොතිබුණි. ඔවුන් මැද ගොවියන්ගේද සහල් උදුරාගත්තේය. එහෙයින් ඔවුනොවුන්ම හුදෙකලා විය. ඔවුන්ගේ නායකයන්ගෙන් කෙනෙක් එහාට මෙහාට පලාගියේය. අවසානයේදී කඳුකරයට යෑමෙන් ඔහුව අල්ලාගෙන මරණයට පත් කළේය. ඉන් අනතුරුව ගමේ ප්‍රභූන් රැස්වීමක් පවත්වා දුප්පත් ගොවීන් කීප දෙනෙක් මරා දැමීය. ඒ කාලයෙහි එහි කොමියුනිස්ට් පක්ෂය නොතිබුණි. මේවා ඉබේ සිදුවන සේ පෙනෙන පංති අරගලයයි.

සමාජය අපිව දේශපාලන වේදිකාවට තල්ලු කර දැමීය. මාක්ස්වාදයට පෙර යමෙකුගේ කැමැත්තට ඉඩ දෙමින් කවුරුහරි සිතා ඇතිද? මට පවා එය ඇසී නොතිබුණි. මට ඇසී තිබුණු දේවල් නැපොලියන්, වොෂිංටන්, මහාපීටර්, කොන්ෆියුසියස්ද කියවා තිබුණි ඉතාලියෙහි තිදෙනා (දේශප්‍රේමීන්) කීර්තිය අත්ලත් කරගෙන තිබුණි. එක වචනයකින් කියතොත් ඔවුන් සියල්ලෝම ධනවාදයේ අයයි. (වීරයෝ) මම ප්‍රෑන්ක්ලින්ගේ ජීවන චරිතයද කියවා තිබුණි. ඔහු දුප්පත් පවුලකින් පැමිණියේය. ඉන් අනතුරුව ඔහු ලේඛකයෙක් විය. විද්‍යුතය ගැනද දිගටම පරීක්ෂණ කරගෙන ගියේය. (වෙන් පෝටා: මිනිසා සතුන්ගේන් සෑදුණු උපකරණයක්ය යන යෝජනාව පළමුවෙන්ම පෙරට දැම්මේ ප්‍රෑන්ක්ලින්ය)

මිනිසා සතුන්ගෙන් සෑදුණු උපකරණයක් වීම ගැන ඔහු කථා කළේය. මිනිසා සිතීමේ සත්ත්වයෙකු බව කියන්නට ඔවුන් පෙරදි පුරුදු විය. "සිතීමේ අවයවය හෘදයයි" සියළුම මැවීමේ ආත්මය මිනිසා බව ඔවුන් කියා තිබුණි. රැස්වීමක් පවත්වා ඔහුව තෝරාගත්තේ කවුද? (ඒ තනතුරට) ඔහු ඔහුවම ගෞරවයට පාත්‍ර කළේය. මෙම යෝජනාව රදළ යුගය තුල පැවැතුණි. මිනිසා සමාජ සත්වයෙක් බවත් උපකරණ සාදන්නෙක් බවත් ඉන් අනතුරුව මාක්ස් ඉදිරියට දැමීය. යථාර්ථය අවුරුදු දශලක්ෂ ගණනක් ගතවීමෙන් (පරිණාමයෙන්) පසු පමණක් මිනිසාට අත්යුගලක් සහ විශාල මොළයක් සංවර්ධනය වීමයි. අනාගතයේදී සත්ත්වයෝද දිගටම සංවර්ධනය ගෙනයාවි. මිනිස්සු තනිවම අත් දෙකක් ලබාගැනීමට සමර්ථවීම, මම විශ්වාස නොකළෙමි. අශ්වයන්ට, ගොනුන්ට,බැටළුවන්ට විකාශනය වෙන්ට පුලුවන්ද? වඳුරන්ට පමණක් විකාශනය විය හැකිද? එය විය හැකිද? තව දුරටත් සියලුම වඳුරන්ගෙන් එක් විශේෂයක් පමණක් පරිනාමය වීමටත්, අනිත් සියල්ලෝම විකාශනය වීමට අසමර්ථ ඇයිද? අවුරුදු දශලක්ෂයක් තුල, අවුරුදු කෝටියක් තුල අශ්වයන්, දෙනුන්, බැටලුවන් එදා පරිදි අදත් පවතීද? ඔවුන් දිගටම වෙනස් වේවි. මම සිතනවා, අශ්වයන්, දෙනුන්, බැටළුවන් සහ සහ කෘමීන් දිගටම වෙනස් වේවි. සතුන් ශාකවලින් විකාශනය වී ඇත. ඒවා මුහුදු බීජ වලින් විකාශනය වී ඇත.

මේ සියල්ල චැන්ග් ටායි යෙන් දැනගත්තේය. කාන්ග් යූ වෙයි සමග ඔහු විප්ලවය ගැන තර්ක කල පොතේ මේ මූලික නීතීන් ඔහු විස්තර කළේය. පොළොව මූලිකව අප්‍රාණිකය. එහි ශාක නොමැත. ජලය නොමැත. වාතය නොමැත. අවුරුදු කෝටි ගණනකට පසු පමණක් ජලය හැදුණු හැටි මම නොදනිමි. පරණ ආකාරයට ජලය හියිඩ්‍රජන් සහ ඔක්සිජන් විද්‍යාමාන නොවීය. හයිඩ්‍රජන් සහ ඔක්සිජන් නිෂ්පාදනය වීමෙන් පසු පමණක් මෙම මුල ද්‍රව්‍ය දෙකම සම්බන්ධවීමෙන් ජලය දීමට පුළුවන්කම ඇති විය.

අපි ස්වභාවික විද්‍යාවේ ඉතිහාසය අධ්‍යනය කල යුතුය. මේ විෂය පැහැර හැරීම නොකළ යුතුය. අපි පොත් කිපයක් කියවිය යුතුය. අපේ වර්තමාන අරගලයේ අවශ්‍යතාවයන් නිසා කියවීම සහ ඉබාගාතේ කියවීම අතර ඉතා විශාල වෙනසක් ඇත. පූ යුන්ග්, සිය දහස් වාරයක් එක්ව වීමෙන් පසු පමණක් හයිඩ්‍රජන් සහ ඔක්සිජන් සෑදුණු බව කියති. දෙකක් එකට බවට සම්බන්ධ වීමේ හේතුව සරල කාරණයක් නොවේ. ඔහු මේ පිළිබඳවද නිවැරදි විය. මට ඔහුව මුණගැසෙන්නට සහ සාකච්ඡා කරන්නට උවමනා විය. නුඹ පූ යුංග් ගේ සෑම දෙයකටම සම්පූර්ණයෙන්ම විරුද්ධ නොවිය යුතුය.

හිත් හෙරටෝ විග්‍රහය සහ සංකලනය පැහැදිලිව අර්ථ දක්වා නැත. විග්‍රහය පැහැදිලිය. නමුත් එහි සංකලනය ගැන බොහෝවක් කියා නැත. මම අයි සූ චි සමග සාකච්ඡාවක යෙදුනෙමි. මේ කාලයෙහි ඔවුන් මනෝභාවාත්මක සංකලනය සහ විග්‍රහය ගැන පමණක් සාකච්ඡා කරන බවත්, විෂය මූලික ප්‍රයෝගික සංකලනය සහ විග්‍රහය ගැන සාකච්ඡා නොකරන බව ඔහු කීවේය. කොමියුනිස්ට් පක්ෂය සහ කූවෝමින්තානය, නිර්ධන පංතිය සහ ධනේෂ්වර පංතිය, ඉඩම් හිමියන් සහ ගොවීන්, චීනය සහ අධිරාජ්‍යවාදීන් ගැන අපි සංකලනය සහ විග්‍රහය කරන්නේ කොහොමද? උදාහරණයක් සඳහා කූවෝමින්තානය සහ කොමියුනිස්ට් පක්ෂයේ හේතුව අපි උදාහරණය සඳහා මෙය කරන්නේ කොහොමද? විග්‍රහය සරල ප්‍රශ්නයකි. අපි ශක්තිමත් වුන හැටි විශාල ප්‍රදේශයක් ලබාගත් හැටි, බොහෝ සාමාජිකයින් ලබාගත් හැටි, බොහෝ හටකණ්ඩායම්. යේනෑන් වැනි මුල කඳවුරු අපේ දුර්වලකම කුමක්ද? අපි විශාල නගර පවත්වා ගෙන ගියේ නැත. අපේ හමුදා සාමාජිකයින් දොලොස් ලක්ෂයක් පමණයි. අපට විදේශ ආධාර නැත. නමුත් කුවෝමින්තානයට විදේශීය ආධාර විශාල ප්‍රමාණයක් තිබුණි. නුඹ ෂැංහයි සහ යෙනෑන් සංසන්දනය කරන්නේ නම් යේනෑනයේ ජනගහණය 7000 ක් පමණකි. (පක්ෂයේ සහ ආණ්ඩුව) ආයතන සහ හට කණ්ඩායම් වලින් එන සංඛ්‍යාවන් මෙයට එකතු කල විට 20000 ක් වේවි (යෙනැනයේ නවතින) කෘෂිකර්මය සහ අත් කර්මාන්ත පමණක් එහි තිබුණි. විශාල නගරයක් සමග මෙය සංසන්දනය කලවිට කොහොමද? අපේ ශක්තිමත්ම කාරණය කුවොමින්තානයෙන් වෙන්වූ ජනතාව නිසා ජනතාවගේ සහාය අපට ලැබීමයි. නුඹට බොහෝ ඉඩම් හට කණ්ඩායම් සහ ආයුධ ඇත. නුඹගේ සොල්දාදුවෝ රාජකාරියක් අත්පත් කරගෙන සිට ඇත. නිළධාරින් සොල්දාදුවන් අතර විරුද්ධත්වය ඇත. ස්වභාවයෙන්ම සටන් කිරීමේ ශක්තිය පවත්වා ගෙන ඔවුන්ගේ හමුදා විශාල ප්‍රමාණයක්ද සිටී. එක පහරකින් ඔවුන් සියල්ලම ඇද වැටීමේ හේතුව කොහෙත්ම එය නොවේ. ඔවුන්ගේ දුර්වල කාරණය මෙහි පවතියි. ප්‍රධාන කාරණය ජනතාවගෙන් ඔවුන්ගේ වියෝවයි. අපි මහජනතාව සමග සමගි වන්නෙමු. ඔවුන් මහජනතාවගෙන් වියෝවී ඇත.

කොමියුනිස්ට් පක්ෂය දේපල සහ ගැහැණුන් පොදුවේ පරිහරනය කරන බව ඔවුන් ඔවුන්ගේ වැඩ පිළිවෙලෙහි කියති. ඔවුන් මේ අදහස් ප්‍රාථමික පාසැල්වලට ගෙනයාමට සැලසුම් කරති. "චූ ටේ සහ මාඕ සේතුං" සියළුම වර්ගයේ දේවල් කරමින් ගිනිතබමින් මිනී මරමින් පෙනී සිටින විට නුඹලා කුමක් කරාවිද? ඔවුන් සිංදුවක් සෑදුවේය. ප්‍රාථමික පාසැල් වල සිසුන්ට එය ගායනා කරන්ට ඔවුන් ඉගැන්නුවේය. එය ඔවුන් ගායනා කිරීමත් සමග ඔවුන් ඔවුන්ගේ මවුවරුන්, පියවරුන්, සහොදරයින්, සහෝදරියන් ගෙන් අපට විරුද්ධ වැඩ පිලිවෙලක් කරන්නට ඇසුවේය. සිංදුව ඇසුණු කුඩා දරුවෙක් ඔහුගේ පියාගෙන් ඇසිය. නුඹ ඇසිය යුතු නැත, නුඹ හොඳින් වැඩුණු පසු නුඹ සොයා ගනීවි, නුඹ එවිට වටහා ගනීවි, ඔහුගේ පියා උත්තර දුන්නේය. ඔහු පාරේ මැද ගමන් කරන්නෙක් විය. එවිට ළමයා ඔහුගේ මාමාගෙන් ඇසීය. මාමා ඔහුට තරවටුකර පිළිතුරු දිණි "මැරීම්, ගිනි, තැබීම් මෙය කුමක්ද? නුඹ නැවතත් මගෙන් ඇසුවොත් මම නුඹට පහර දෙන්නෙමි. පෙර ඔහුගේ මාමා කොමියුනිස්ට් තරුණ සංගමයේ සාමාජිකයෙක් විය. සියළුම පුවත් පත් සහ ගුවන් විදුලි මධ්‍යස්ථාන අපට පහර

දුණි. පුවත්පත් තොගයක්ම තිබුණි. සෑම නගරයකම දුසිම් කීපයක් තිබුණි. සෑම භේදයක්ම දිවීය. ඒවා සියල්ලම කොමියුනිස්ට් විරෝධීය. සියලුම පොදු ජනතාව ඒවාට ඇහුම් කන් දුන්නේනේද?

චීන කටයුතු සම්බන්ධයෙන් අපට අත්දැකීම් ටිකක් තිබුණි " චීනය ගේ කුරුල්ලෙකි" විදේශීය රටවලද වෙනත් දෙයක් නොමැත. දුප්පත් පොහොසත්, විප්ලවය සහ ප්‍රතිවිප්ලවය, මාක්ස් ලෙනින්වාදය සහ සංශෝධනවාදයයි. සෑම කෙනෙක්ම කොමියුනිස්ට්වාදයට විරුද්ධව එකතුවීම සහ කොමියුනිස්ට් විරෝධී වැඩ පිළිවෙල ගන්නා බව නුඹ විශ්වාස නොකල යුතුය. අපි ඒ කාලයෙහි පුවත්පත් කියවා නොමැතිද? නමුත් ඒවායින් අපව පාලනය නොවීය.

මම වාර පහක් රතු කාමරයේ සිහිනය කියවා ඇත. එය බලපවත්වා නොමැත. මම එය ඉතිහාසය ලෙස කියවීමි. ජනතාව රතු කාමරයේ සිහිනය කියවන විට, ඔවුන් හතරවෙනි පරිච්චේදය සැලකිල්ලෙන් කියවන්නේ නැත. නමුත් මෙම පරිච්චේදයේ පොතෙහි සාරාංශය අඩංගුය. ජන්ග් කුයි මන්දිරය විස්තර කරන ලෙන්ග් ෂු-ෂින්ග්, සටහන් සහ සිංදු සාදයි.  හතර වෙනි පරිච්චේදයේ බෝතල් පතුලේ යතිවරයා බෝතල් පතුලේ කටයුතු තීරණය කරයි. නිළධාරීන් සඳහා වශීකරණ යන්ත්‍රය ගැන කථා කරයි. එය විශාල පවුල් හතර හඳුන්වා දෙයි.

නැන්කින් චියාට
ප්‍රීති ඝෝෂා
භාජනවලින් ගත්
ඔවුන්, ඔවුන්ගේ රත්රන් කිරති.
අහ් - පාන්ග් මාළිගය
අහස සිඹිනවා.
නමුත් නැන්කින්හි
වගේ මාළිගය නොමැත.
සාගර රජු
හුදෙකලාවේම යති.
නැන්කින් වැන්ග්ට
ඔහුගේ මිටි රත්තරන් ඇඳන්,
නැන්කින් ෂියා
කෙතරම් පොහොසත්ද?
සම්පූර්ණ දවසක්ම
ඔවුනගේ මුදල් ගණන් කරන්නට......

රතු කාමරයේ සිහිනය විශාල පවුල් හතර එකින් එක විස්තර කරයි. පාලක පංතියේ මේ මිනිස්සු තිහක් හෝ විස්සක් වුවද, බොහෝ දුසිම් ගණනක් වූ ජනතාවගේ ඉරණම සම්බන්ධ කරන දරුණු පංති අරගලයක් සනිටුහන් කරයි. (එය තිසිතුන් දෙනෙක් බවට ගණන් බලා ඇත) මේ ප්‍රදේශයේ ඒවා යූ යැන්ග්, සැසුචි, දෙවෙනි සහොදරිය යූ, තුන්වෙනි සහෝදරිය යූ, උදාහරණ වශයෙන් වූ තුන්සියයකට අධිකය. අනික්වා සියල්ලම වහලුන් ගැනය. ඉතිහාසය අධ්‍යනය කිරීමේ ආරම්භක ලක්ෂය වශයෙන් පංති අරගලයේ දැක්ම නුඹ ගන්නේ නැත්නම් නුඹ වරදවා වටහා ගනිවි. පංති විග්‍රහය ප්‍රයෝජනයට ගනිමින් පමණක්, දේවල් විග්‍රහ කල හැක. රතු සිහිනයේ කාමරය ලිවීමේ සිට අවුරුදු දෙසීයකටත් වඩා ගතවී ඇත. පොත පදනම් කරගත් පර්යේෂණ වර්තමාන දවසේ පවා පැහැදිලි ඉදිරිපත් කිරීම් නැත. මෙයින් ප්‍රශ්ණවල අමාරු බව අපට දැකීමට පුළුවන. යූ පිංග් පෝ සහ වැන්ග් කැන් පන් යන දෙදෙනාම විශේෂඥයෝ වෙති. හො චි- පැන්ග්ද පෙරවදනක් ලිවීය. වූ සී චැන්ග් හැඳින්වූ සහකාරයෙක් තිරයේ පෙනී සිටියේය. මේ සියල්ලම රතු කාමරයේ සිහිනය ගැන මෑතදී පර්යේෂණ පෙන්වයි. පැරැණි අධ්‍යනයන් එක එක සඳහන් කරන්නට මට උවමනා නැත. රතු කාමරයේ සිහිනය පිළිබඳ ටිසායි යූවායි පෙයිගේ දැක්ම වැරදිය. හූ සින් කියන දෙය වඩාත් නිවැරදිය.

සංකලනය කුමක්ද? මහා භූමි ප්‍රදේශයෙහි සංකලනය වී සිටි කොමියුනිස්ට් පක්ෂය සහ කුවෝමින්තානය යන දෙකෙහි සියලුම ප්‍රතිවිරුද්ධතාවයන් පිළිබඳව නුඹට සාක්ෂි ඇත. සංකලනය මේ ආකාරය ගත්තේය. ඔවුනගේ හමුදා ආවේය. අපි ඔවුන්ව වනසා දැමීය. ඔවුන්ට තුවාල කරමින් වනසා දැම්මේය. යැංග් චියන් වෙන් විසින් විස්තර කරන පරිදි දෙකක් එකක් බවට සම්බන්ධ කිරීම හේතුවක් නොවේ. විරුද්ධාර්ථයන් සාමකාමීව එකට පැවතීමේ සංකලනය එය නොවේ. ඒවාට සාමකාමීව එකට පැවතීමට උවමනා නොවීය. ඒවාට නුඹව වනසා දැමීමට උවමනා විය. අනික් කාරණය ඔවුන්ට යෙනෑන් වලට පහරදීමට වුණේ ඇයිද? මායිම් තුනෙහි හිසියන් තුන හැර සෑම තැනටම ඔවුන්ගේ හමුදාව කාවැදුණෝය. නුඹට නුඹගේ නිදහස ඇත. අපට අපගේ නිදහස ඇත. නුඹට 250000 ක් ඇත. අපට 25000 ක් ඇත. බ්‍රිගේඩ් කීපයක මිනිස්සු 20000 කි. විග්‍රහය කොහොමද? අපි සංකලනය කරන්නේ කොහොමද? නුඹට කොහේ හෝ යාමට උවමනා නම්, නුඹ ඉදිරියෙන් හරියට යන්න. නුඹගේ හමුදාව කටපුරා හිනාවෙන විට, අපි නිශ්චලව ඉවසා සිටිනවා. අපි ජයග්‍රාහීව සටන් කරන්නේ නම්, අපි සටන් කරනවා. අපි දිනන්නේ නැතිනම්, අපි පසු බසින්නෙමු. 1947 මාර්තුවල සිට 1948 මාර්තු තෙක් සම්පූර්ණ භූමි දර්ශනයෙන් (හතුරාගේ) නොපෙනී ගියේය. අපි ඔවුන්ගේ හමුදා භටයින් දස දහස් ගණනින් විනාශ කර දැම්මෝය. අපි අයි අපි අයි චුවාන් වට කල විට, නගරය නිදහස් කර ගැනීමට ලියුකාන් ආවේය. ප්‍රධාන අණදෙන

නිළධාරී ලියුකාන් මරා දැමීය. ඔහුගේ පලාත් නිළධාරී තිදෙනා ගෙන් දෙදෙනෙක් මරා දැමීය. අනිත් අය සිර කරුවන් ලෙස ගැනුණි. සම්පූර්ණ හමුදාව වනසා දැමුණි. මෙය සංකලනයයි. ඔවුන්ගේ සියළුම කාල තුවක්කු අපේ පැත්තට සංකලනය විය. සොල්දාදුවන්ද සංකලනය විය. නැවතීමට උවමනා වූ අය අප සමග නැවතුණි. අප සමග නැවතීමට උවමනා නොවූ අයට ඔවුන්ගේ ගමන් වියදම් සඳහා මුදල් දුන්නේය. අපි ලියුකාන් සම්පූර්ණයෙන් විනාශ කර දැමීමෙන් පසු, අයි චුවාන්, සටන් කිරීමෙන් තොරවම යටත් විය. ශ්‍රේෂ්ඨ ආක්‍රමණයන් තුන ලියාඕ, ෂෙන්, හුවායි හයි, සහ පිකිං- තියන්සින්ය සංකලනයේ අපේ ක්‍රමය කුමක්වීද? සටන් කරන්නේ නැතිව, පූ හායි ඔහුගේ මිනිස්සු 4,00,000 ක් සමග අපේ පැත්තට සංකලනය විය. ඔවුන්ගේ රයිෆල් සියල්ලම බාර දුනි. එක් දෙයක් වෙනත් දෙයකි. කෑම, ලොකු මාලුවා පොඩි මාලුවා කෑම, මෙය සංකලනයයි. එය පොතෙන් මේ වගේ කවදාවත් ඉදිරිපත් විය නොහැක. මම කවදාවත් මගේ වෙනත් පොත්වලින් එකකවත් මේ ආකාරය ඉදිරියට දමා නැත. ඔහුගේ කොටස් වශයෙන් යැංගි සියන් - චෙන් සංකලන දෙකක් එකට සම්බන්ධවන බවත් විශ්වාස කරති. මේ ලෝකයේ ස්ථිරසාරවූ බැඳීම කුමක්ද? දේවල් ස්ථිරසාරව බැඳී නැත. අවසානයේ ඒවා සේවය කල යුතුය. සේවය නොකරන දෙයක් පැවතිය නොහැක. අවුරුදු 20 ක් පැරැණි අපේ යුද්ධයේ අරගලවලදී සතුරා අපේ බොහෝ දෙනෙක් විනාශකර දමා ඇත. තුන් ලක්ෂයකින් ශක්තිමත් රතු හමුදාව, සෙන් කියාන්කින් ප්‍රදේශයට ළඟාවූ විට 25,000 ක් පමණක් ඉතිරි විය. අනිත් අයගෙන් කොටසක් වැනසුණේය. කොටසක් පළවා හැරීය. කොටසක් මරා දමනු ලැබීය. තුවාල කරනු ලැබීය.

විරුද්ධාර්ථයන්ගේ සමගිය සාකච්ඡා කිරීමේ ආරම්භක ලක්ෂය වශයෙන් අපි ජීවිතය ගත යුතුය. *(සහෝදර කාන්ග් ෂෙන්: එය සංකල්පයක් සාකච්ඡා කරන්නට විතරක් නොවනු ඇත)*

විග්‍රහය කිරීමේදී සංකලනයද ඇත. සංකලනය කිරීමේදී විග්‍රහයද ඇත.

මිනිස්සු, සතුන් සහ ශාක ආහාරයට ගන්නා විට ඒ සටනින්ම විග්‍රහයද පටන් ගැනුණි. අපිට වැලි ආහාරයට ගත නොහැකි ඇයි? බත් වල වැලි තිබෙන විට එය කැමට හොඳ නොවේ. ගෝවා වගේ දේවල් පමණක් ආහාරයට ගන්නා නමුත් අශ්වයන්, ගොනුන්, බැටළුවන් මෙන් අපි තණ කොළ ආහාරයට නොගන්නේ ඇයි? අපි සෑම දෙයක්ම විග්‍රහය කල යුතුය. ෂෙන් තන්ග්, ඖෂධීය පැලෑටි සියයක රස බැලිය. බෙහෙත් ද්‍රව්‍යය නිපදවීමේදී ඒවා ප්‍රයෝජනයට ගැනේ. අවුරුදු ලක්ෂ ගණනකට පසුව අවසාන විග්‍රහයේදී කෑමට හොඳ දෙය කුමක්ද? නරක දෙය කුමක්දැයි පැහැදිලිව එළිදරව් කලේය. පළාගිරවුන්, සර්පයින්, කැස්බෑවන්, ආහාරයට ගත හැක. කකුළුවන් බල්ලන් සහ ජලයෙහි වසන ජීවීන් කෑමට පුළුවන. ඒවා ආහාරයට නොගන්නා විදේශිකයෝ ටික දෙනෙක් සිටිති. උතුරු සෙන්සිවල, ඔවුහු ජලජ ජිවීන් ආහාරයට නොගනිති. ඔවුහු මත්ස්‍යයින් ආහාරයට නොගනිති. එක් අවුරුද්දක කහ ගඟේ විශාල ගංවතුරක් ගැලුවේය. මාලු රාත්තල් දශ ලක්ෂ ගණනක් වෙරළ මත ගොඩ ගැහුණි. ඔවුන් ඒවා සියල්ලම පොහොර සඳහා යොදා ගත්තේය.

මම ජාතික දර්ශනවාදියෙක් වෙයි. නුඹලා විදේශදර්ශන වාදියෝ වෙති.

*(සහෝදර කාන්ග් ෂෙන්ග්: වර්ග තුනක ප්‍රශ්න ගැන සභාපති සහොදරයාට යම් දෙයක් කීමට ඇතිද?)*

එංගල්ස් වර්ග තුනක් ගැන කථා කර ඇත . නමුත් මා සඳහා එම වර්ග වලින් දෙකක් විශ්වාස නොකරයි. (විරුද්ධාර්ථයන්ගේ ඒකත්වය වඩාත්ම මූලික නිතියයි ගුණාත්මක භාවය ප්‍රමාණාත්මක භාවයට පරිවර්තනය වීම, විරුද්ධාර්ථයන්ගේ ගුණය සහ ප්‍රමාණය ඒකත්වයේ තවත් ආකාරයකි. කොහෙත්ම නිෂේධනයේ නිෂේධනය විද්‍යාමාන නොවෙති.) ගුණාත්මකභාවය, ප්‍රමාණාත්මකභාවයට පරිවර්තනය වීම වෙනත් එකක් බවට එක සමාන මට්ටමට ලඟා වීම, නිෂේධනයේ නිෂේධනය සහ විරුද්ධාර්ථයන්ගේ ඒකත්වයේ නීතිය තුන් ආකාරයයි. අද්වෛතන වාදය නොවේ. වඩාත්ම මූලික දෙය විරුද්ධාර්ථයන්ගේ සමගියයි. ගුණාත්මක භාවය සහ ප්‍රමාණාත්මක භාවය වෙනත් දෙයකට වෙනස් වීම, ප්‍රතිවිරුද්ධාර්ථයන්ගේ සමගියේ ගුණය සහ ප්‍රමාණයයි. නිෂේධනයේ නිෂේධනය වෙනත් දෙයක් නොවේ. පැවතීම, නැතිවීම දේවල්වල සංවර්ධනයයි. සිදුවීම් දම්වැලේ සෑම පුරුකක්ම පැවතීම සහ නැතිවීම දෙකම වේ. වහල් හිමි සමාජය ප්‍රාථමික සමාජය අහෝසි කලේය. එය රදළ සමාජයට පැවතීම හැරවීම තහවුරු කලේය. රදළ සමාජය, වහල් සමාජය තුල තිබුණු සම්බන්ධතාවයන් අහෝසිකිරීම තහවුරු කලේය. නමුත් එය ධනේශ්වර සමාජයේ පැවැත්ම සම්බන්ධයෙන් හැරවීම විය. ධනේශ්වර සමාජය මගින් රදළ සමාජ සම්බන්ධතාවයන් අහෝසිකිරීම විය. නමුත් එය සමාජවාදී සමාජය පැවතීමේ සම්බන්ධතාවයන්ට හැරවීම විය.

සංකලනය කිරීමේ ක්‍රමය කුමක්ද? ප්‍රාථමික සමාජයෙහි වහල්හිමි සමාජයෙහි පැත්තෙන් පැත්ත විද්‍යාමාන නොවන්නේද? ඒවා සම්පූර්ණ දෙයින් කුඩා කොටසක් පමණක් විද්‍යාමාන වේ. සම්පූර්ණ චිත්‍රය ප්‍රාථමික සමාජය ඉවත් කරන්ට යමින් තිබෙන බවයි. ඇරත් සමාජ සංවර්ධනය අදියරයන්ට පත්වෙයි. ප්‍රාථමික සමාජයද බොහෝ උසස් අවදීන්ට යෙදුනේය. එම කාලයෙහි මැරුණු ස්වාමියාත් සමග ඔවුන්ගේ බිරන්දෑවරුන් වලදැමීමේ ක්‍රියාව නොතිබුණි. නමුත් ඔවුන්ට මිනිසුන්ට යටත් වෙන්නට බලකෙරී තිබුණි. පළමුවෙන් මිනිසුන්, ගැහැනුන්ට යටත්ව සිටියේය. එවිට දේවල් ඔවුන්ගේ විරුද්ධ පැත්තට මාරු විය. ගැහැණු, මිනිසුනට යටත් විය. තවත් අවුරුදු දශලක්ෂයක් යෑමෙන් වුවද ඉතිහාසයේ මෙම අවස්ථාව තවම පැහැදිලි නැත. අවුරුදු පන්දහසක් ගතවිත් පංති සමාජය තවම නැත. ප්‍රාථමික යුගය අවසානයේ යැංග් සායි සහ ලුන්ග් සාන් වැනි සංස්කෘතීන්හි පාටකල මැටි

බඳුන් තිබුණි. එක් වචනයකින් එකක් අනික කා දමයි. එකක් අනික ඉවතට වීසි කරයි. එක් පංතියක් අහෝසි වෙයි. වෙනත් සමාජයක් නැගෙයි. ස්වභාවයෙන්ම සංවර්ධනයේ ක්‍රියාමාර්ගය එයයි. සෑම දෙයක්ම පිරිසිදු නොවේ.

රදළ සමාජයට පැමිණුන විට රදළ ක්‍රමය, සමාජ මන්දිරයේ විශාල කොටසක චරිත ලක්ෂන අත්පත් කර ගත්තාවූද වහල් සමාජ ක්‍රමයේ සමහර දේවල් ඉතිරිව පවතී. ප්‍රවේණි දාසයින්ද, බැඳුණු කම්කරුවන්ද, හස්තකර්මාන්ත ශිල්පීන්ද තවමත් සිටිති. ධනවාදි සමාජයෙහිද සියල්ලම පිරිසිදු නොවේ. දියුණු ධනවාදී සමාජය තුල පවා පසුගාමී කොටසක්ද ඇත. උදාහරණ වශයෙන් දකුණු එක්සත් ජනපදයේ වහල් ක්‍රමය ඇත. ලින්කොලින් වහල් ක්‍රමය අවලංගු කලේය. නමුත් කළු වහල්ලු අඳද තවමත් සිටිති. ඔවුනගේ අරගලය ඉතා දරුණු විය. දශලක්ෂ 20 කට වඩා ජනතාව එයට සහභාගි වෙමින් සිටිති. එය නිවැරදිය.

එක් දෙයක් තවත් දෙයක් විනාශ කරයි. දේවල් මතුවෙයි. සංවර්ධනය වෙයි. විනාශ වෙයි. සෑම තැනම මේ ආකාරයයි. වෙනත් දෙයක් මගින් දේවල් විනාශ නොවන්නේ නම්, ඒවා ඒවායින්ම විනාශවෙයි. මිනිස්සු මැරෙන්නේ ඇයි? රදළ ආණ්ඩුද විනාශවුයේ ඇයි? මෙය ස්වාභාවික නීතියකි. මිනිස් වර්ගයාට වඩා දිගු කාලයක් වනාන්තර ජීවත් වෙයි. එහෙත් ඒවා පවා අවුරුදු දහස් කීපයක් පමණයි. එවැනි දේවල් මරණයට පත්නොවේ නම් එය පොළවට දැරිය නොහැකි වනු ඇත. අපිට කොන්ෆියුසියස් තවමත් ජීවත්ව දකින්ට නම්, පොළවට බොහෝ මිනිස්සු දරාගන්නට හැකියාව නැත. චන්ග් මුසුගේ ප්‍රවේශය මම අනුමත කරමි. ඔහුගේ බිරිඳ මිය ගිය විට ඔහු බේසමකට තඩි බෑවේය. සිංදු කීවේය. මිනිස්සු මිය ගිය විට පැරැණි දෙයෙහි විනාශය සමරන්ට සහ ද්විඝටනයේ ජයග්‍රහණය සමරන්ට කොටස් සිටිය යුතුය. සමාජවාදයද අහෝසි වේවි. එය අහෝසි නොවන්නේ නම් එවිට කොමියුනිස්ට්වාදය නොතිබෙනු ඇත. කොමියුනිස්ට්වාදයද අවුරුදු දසදහස් ගනනක් පවතීවි. ගුණාත්මක වෙනස්කම් විසින් අවදීන්ට එය නොබෙදන බවත්, කොමියුනිස්ට්වාදය යටතේ ගුණාත්මක වෙනස් කම් නොමැති බවත් මම විශ්වාස නොකරමි. මම එය විශ්වාස නොකරමි. ප්‍රමාණාත්මක භාවය ගුණාත්මක බවටත්, ගුණාත්මකභාවය ප්‍රමාණාත්මකභාවය බවටත් වෙනස් වෙයි. අවුරුදු දශලක්ෂ ගණනක්ම වෙනස් නොවෙමින් හරියටම එම ගුණාත්මකභාවය ඉතිරිවී පවතින බව මම විශ්වාස නොකරමි. ද්විඝටනයේ ආලෝකයෙන් මෙය දිනිය නොහැකිය. එවිට එහි මූලික වන්නේ "එකිනෙකාගෙන් ඔහුගේ හැකියාවට අනුව එකිනෙකාට ඔහුගේ අවශ්‍යතාවය අනුව" මෙයයි. එවැනි ආර්ථිකයක් සමග අවුරුදු දශලක්ෂයක්ම ඒවා ඉටුවෙනවා නුඹ විශ්වාස කරනවාද? නුඹ ඒ ගැන සිතා තිබෙනවාද? ඒවා එසේම තිබෙනවානම් අපිට ආර්ථිකයක් අවශ්‍ය නොවනු ඇත. වෙනත් හේතුවකින් අපි පාඩම් පොතකින් හුදකලාව ලබාගනු ඇත.

ද්විඝටනයේ ජිවිතය විරුද්ධ දෙසට අයත් වූ ව්‍යාපාරයයි. අවසානයේ මිනිස් වර්ගයාගේ ඉරණමද හමුවනු ඇත. දේව ධර්මයින් ඉරණම් දවස ගැන කථා කරන විට, ඔවුන් ජනතාව බියගැන්වීට සහ සර්ව ශුභවාදී වෙති. මිනිස් වර්ගයාගේ කෙළවර ගැන යම් දෙයක් අපි කියන විට මිනිස් වර්ගයාට වඩා උසස් දෙයක් නිෂ්පාදනය කරාවි. මිනිස් වර්ගයා ළදරුවියේ තවම සිය අවශ්‍යතාවයේ රාජ්‍යයෙන් නිදහසේ රාජ්‍යයට වෙනස්වීම ගැන එංගල්ස් කථා කලේය. අවශ්‍යතාවය වටහා ගැනීම නිදහස බව කීවේය. මෙම වාක්‍යය සම්පූර්ණ නොවේ. එය සිතාගත හැකි විශ්‍රාමය නිවාඩු සහ එක හමාරක් පමණක් පමණක් කියයි. එය නුඹට නිදහස ඇති කරනවා. හුදු වටහා ගැනීමද? නිදහස අවශ්‍යතාවය වටහා ගැනීම සහ අවශ්‍යතාවය වෙනස් කිරීමයි. කෙනෙකුටම වැඩ ටිකක් කරන්නට තිබෙනවාද? නුඹට කරන්නට කිසිම වැඩක් නැතිව නිකම්ම කන්නේ නම් එය සෑහෙන බව නුඹ නිකම්ම වටහා ගන්නවාද? නුඹ නීතියක් අනාවරණය කරගන්නා විට, නුඹට එය යොදවන්ට හැකිවිය යුතුය. නුඹ වෙනත් ක්‍රමයකින් ලෝකය නිර්මාණය කල යුතුය. නුඹ පොළව කැණිය යුතුය. උසස් ගොඩනැගිලි සෑදිය යුතුය. නුඹ ආකර හැරිය යුතුය. කර්මාන්ත කල යුතුය. අනාගතයේදී වඩාත් මිනිස්සු වැඩිවී සෑහෙන තරම් ධාන්‍ය නොතිබේවි. එහෙයින් මිනිස්සුන්ට ඛණිජ වලින් ආහාර ලබා ගන්නට සිදු වනු ඇත. මෙසේ අනාගතයේදී සියළුම දේවල් වලින් නිදහස් වෙන්ට හැකිවනු ඇත.

වෙනස් වීම් වලින් පමණක් නිදහස අත්පත් කර ගත හැක. අනාගතයේ අහස්යානාවන් අනේක සංඛ්‍යාවක් අහසේ එහාට මෙහාට මැස්සන් මෙන් පියාසර කරනු ඇතැයි ලෙනින් කීවේය. සෑම තැනම ඒවා ගැටේවි. අපි ඒ ගැන කරනනේ කුමක්ද? අපි ඒවාට යොදන උපාය කොහොමද? අපි එසේ කරන්නේ නම් දේවල් සියල්ලම නිදහස්ව සිටීවිද? වර්තමානයේ පීකිංවල බස් දස දහසක් ඇත. ටෝකියෝ වල ලක්ෂයක් වාහන ඇත (හෝ එය 8,00,000) එහි රිය අනතුරු බොහෝ වෙති. අපිට කාර් ටිකක් ඇත. මෙතැන් සිට අවුරුදු දස දහසක් පීකිංවල ඒවා කුමක් කරාවිද? තවමත් බස් එහි 10,000 ක් තියේවිද? ඔවුන් අලුතින් යම් දෙයක් නිපදවයි එසේ ඔවුන්ට ප්‍රවාහනයට අවශ්‍ය දේවල් බෙදා දීමට පුළුවන. එවිට මිනිසුන්ට පියඹා ගිය හැක. සරල යාන්ත්‍රික උපකරණ ප්‍රයෝජනයට ගනිමින් ඔවුන් කැමැති සෑම බිමකටම යම්කිසි ස්ථානයකට පියඹා ගිය හැක. අපිට හරියටම අවශ්‍යතාවය වටහා ගන්ට බැරිනම් දේවලට වෙනස් විය යුතුය.

කොමියුනිස්ට්වාදය ගුණාත්මක වෙනස්කම් ඇති නොවන බවත්, අවදින් වලට නොබෙදෙන බවත් මම විශ්වාස නොකරමි. සියලුම දේවල් බෙදිය හැකි බව ලෙනින් කීවේය. උදාහරණයක් වශයෙන් ඔහු පරමාණුව ඉදිරිපත් කලේය. පරමාණුව බෙදිය නොහැකි බව කියා තිබුණි. පරමාණුක න්‍යෂ්ටිය කැඩීමට කැපවුණු විද්‍යාත්මක ශාඛාව තවම තරුණය. අවුරුදු විස්සක් තිහක් පමණ වයසය. මෑත දශකවල විද්‍යාඥයෝ මීසෝන සහ මීසෝන විරෝධී කොටස් වශයෙන් පරමාණුවේ න්‍යෂ්ටියේ අඩංගු දේවල් විසඳා ඇත. මේවා කීපයක් බරය. නමුත් කීපයක් සැහැල්ලුය. දෙවෙනි ලෝක යුද්ධයෙන් පසු කරගෙන යනු ලැබූ දේවල් වලින් මෙම කොටස වඩාත්ම අනාවරණය වී

ඇත. පරමාණුක න්‍යෂ්ටිය වෙන් කරන්නට පුලුවන් කාරණය යම්කාලයකට පෙර අනාවරණය කරගෙන තිබුණි. ඇළුමිනියම් හෝ තඹ පිටතින් සම්බන්ඹ නැති ඉලෙක්ට්‍රෝන සන්නායක කම්බියක් මගින් ප්‍රයෝජනයට ගනියි. පෘථිවියේ අන්තරික්ෂයේ ලී 300 (කිලෝමීටර 150) ක් තුල සම්බන්ධ නැති ඉලෙක්ට්‍රෝන තට්ටු තිබෙන බව අනාවරණය කරගෙන ඇත. ඉලෙක්ට්‍රෝන සහ පරමාණුක න්‍යෂ්ටිද වෙන්වී පවතී. එහෙත් තවම ඉලෙක්ට්‍රෝන කඩා දැමිය නොහැක. නමුත් යම් දවසක ඒවා එක්තරා ප්‍රමාණයකට කඩා දමාවි. " එක් පාදයක දිග එක් දිනකදී භාගයකට බෙදිය හැකි වුවද, කවදාවත් බිංදුවට අඩු නොවේවි" චන්ග් පූ කීවේය. ( චන්ග් පූ පිටුව 33 "විවිධ පාසැල් ගැන" උපුටා ගැනීම් කුන්ග් සන් ලුන්ග්) මෙය සත්‍යයයි නුඹ විශ්වාස කරන්නේ නැතිනම් කල්පනා කර බලන්න. එය බිංදුවට අඩුකරන්නට පුළුවන් වුණිනම් විද්‍යාවක් වශයෙන් එවැනි දෙයක් නොතිබෙනු ඇත. ශත සහස්‍ර දේවල් අඛණ්ඩව සහ සීමාවක් නැතිව සංවර්ධනය වෙයි. ඒවා අනන්ත ප්‍රමාණ වෙයි. කාලය සහ අවකාශය අනන්ත අප්‍රමාණ වෙයි. අවකාශය සැලකිල්ලට ගෙන සූක්ෂම දර්ශකයකින් බැලීමෙන් ඒවා අනන්ත අප්‍රමාන වෙයි. එය කෙලවරක් නැතිව බෙදීමට පුළුවන. එහෙයින් අවුරුදු දශලක්ෂයකට පසුව පවා විද්‍යාඥයන්ට කරන්නට වැඩ ඇත. "සකෝටා" විසින් ස්වාභාවික විද්‍යාව ගැන බුලයින්ගේ මුලික කොටස් ගැන ලිපිය මම ඉතාමත් අගය කරමි. මෙය ද්විඝධනාත්මක ද්‍රව්‍යවාදයයි. ඔහු ලෙනින් උපුටා දක්වයි.

*"දර්ශනවාදයේ දුර්වලකම දර්ශනවාදය ප්‍රායෝගික නොවීමත් පොත්වල පමණක් දර්ශනවාදය ඉදිරිපත් වීමත්ය"*

අපි සෑම විටම අලුත් දේවල් ඉදිරියට දැමිය යුතුය. අනික් කාරණය අපි මෙහි සිටින්නේ කුමක් සඳහාද? අපේ පරම්පරාවන් සඳහා උවමනාව කුමක්ද? අලුත් දේවල් යථාර්ථය සොයාගැනීමටයි අපි යථාර්ථය ග්‍රහණය කළ යුතුය. අවසාන විග්‍රහයේදී ජෙන් චි යු මාක්ස්වාදියෙක්ද? නැද්ද? ඔහුගේ බුද්ධාගම පිළිබඳ ලිපි මම මහත් ඉහලින් අගය කරමි. ඔහු ටැන්ග් යුන්ග්-ටුන්ගේ ශිෂ්‍යයෙක් විය. ඒවා සමහර පර්යේෂණයන්ය ඔහු මැන්ග් රාජ වංශයේ බුද්ධාගම පමණක් සාකච්ඡා කරයි. පසුකාල වල බුද්ධාගම පිළිබඳව කෙලින්ම සාකච්ඡා නොකරයි. සුන්ග් සහ මින්ග් මැන්ග් රාජවංශයේ චැන් පාසැලෙන් පාර භෞතිකවාදය වර්ධනය කර මනෝමූලික විඥාණවාදයෙන් විෂයමූලික විඥාණවාදයට හැරවීමේ ව්‍යාපාරයක් එහි තිබුණි. බුද්ධාගම සහ ටාඕවාදය යන දෙකම තිබුණි. ඒවා පැහැදිලිව වටහා ගන්නට එය අසමත් නොවේ. ඒවාට හරියාකාරව අවධානය යොමු කරන්ට (හරියාකාරව) නොහැකිවුයේ කොහොමද? හැන් යු, අර්ථය කථා කළේය. "ඔවුන්ගේ උච්චාරණයෙන් නොව අදහස්වලින් ඉගෙන ගන්න" ඔහුගේ සටන් පාඨය විය. ඔහුගේ අදහස් අනිත් අය ගෙන් පිටපත් කල ඒවාය. නිබන්ධයේ රචනා ක්‍රමයේ රීතිය වෙනස් කළේය. ඔහු අර්ථය සාකච්ඡා නොකලේය. පුරාණයෙන් ගත් දේවලින් කුඩා කොටසක් සාකච්ඡා කලේය. ගුරුවරුන් පිළිබඳ දේශනා වගේ අලුත් ලිවීම් ටිකක් තිබුණි. ලියු ෂූ හව් වෙනස් විය. ඔහු බුද්ධාගමේ ඇතුලත් පිටත් සහ ටාඕවාදයේ ද්‍රව්‍යවාදයන් දැන ගත්තේය. එහෙත් ඔහුගේ දෙව්ලොව පිළිතුරුද ඉතාමත්ම කෙටිවිය. ඔහුගේ දෙව්ලොව තොරතුරු වූ යුවාන්ග් ගේ දෙව් ලොව ඇසීම් වල නිෂ්පාදනයකි. අවුරුදු දහස් ගණනක්ම දෙව්ලොව ගැන පිලිතුරු එක මිනිසෙක් ලියන ලද කොටසක් කියාපායි. දෙව්ලොව ගැන අසන්නේ කුමක්ද? දෙව්ලොව ගැන පිළිතුරු කුමක්ද? එහි විවරණ නොවෙත් නම්, එය පැහැදිලිව විස්තර කරන්ටත්, නුඹ එය කියවන්නේ වුවද, නුඹට එය අවබෝධ කරගත නොහැක. නුඹ සාමාන්‍යය අදහස පමණක් ලබා ගනිවි. දෙව්ලොව ගැන ඇසීම් මනඃකල්පිතය. අවුරුදු දහස් ගණනකට ඉහතදීත් සියලුම වර්ගයේ ප්‍රශ්න ඉතිහාසයට, ස්වභාවයට, විශ්වයට, සම්බන්ධතාවයන් ඉහලට ඔසවා ඇත.

1964.08.18

සභාපති මාඕ සේතුං

**මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායමේ පරිවර්තනයකි.**